# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,309 — 1937ක්වූ අගෝස්තු මස 13 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

### උපාධගනීති.

**රාජ්‍ය සභාවේ ජන්දදායක නාමලේඛන 1937වෙනි අවුරුද්දට සංශෝධනයකිරීම.**

**උතුරු කොළඹ, මධ්‍යම කොළඹ සහ දකුණු කොළඹ යන ජන්දදායක කොට්ඨාශ සම්බන්ධවයි.**

1931වෙනි ලංකා (රාජ්‍ය සභා තේරීම් පිළිබඳ) රාජ්‍ය සභා නියෝගයේ 7වෙනි වගන්තිය යටතේ උතුරු කොළඹ, මධ්‍යම කොළඹ, දකුණු කොළඹ යන ජන්දදායක කොට්ඨාශවල ජන්දදායක නාමලේඛනවල සවකීය නම් ඇතුළත් කරවාගැනීමට ලංකාවේ නිත්‍ය පදිංචිය නිසා සුදුසුකම් ඇත්තාවූද වෙන අන්දමකින් සුදුසුකම් නැත්තාවූද අයවළුන් එකී ජන්දදායක කොට්ඨාශවල ජන්දදායකයන් මෙන් ලියාපදිංචිකිරීම පිණිස ඔවුන්ගේ නම් නියවයකොට දැනගැනීම සඳහා ආණ්ඩුවේ ලිපිකරු සමූහයක් ගණන්ගැනීමේ මූලාදෑනීන් (Enumerators) හැටියට පත්කර තිබෙන බව එසේ ඒ නම් ලියාපදිංචිකරවාගැනීමට සුදුසුකම් ඇති සැමදෙනාගේම දැනගැනීම පිණිස මෙයින් දැනුම්දෙනු ලැබේ.

කම්බාට නියමකර තිබෙන ඒ ඒ කොට්ඨාශවල පිහිටි ගෙවල් වලට 1937 අගෝස්තු මස 10වෙනිදවත් 31වෙනිදටත් අතර පැමිණ ඉහත සඳහන් තොරතුරු දැනගැනීමට එක් එක් ගණන්ගැනීමේ මූලාදෑනියාට නියමකර තිබේ.

ඉහතකී ගණන්ගැනීමේ මූලාදෑනීන්ට සංශෝධිත ජන්දදායක නාමලේඛන හැකිතරම් සම්පූර්ණව සාදගත හැකිවීම පිණිස ඇබෑවූද නිවැරදිවූද තොරතුරු සපයාදීම සඳහා ඔවුන්ට සහභාගිවන මෙන් ඊට සම්බන්ධවූ සැමදෙනාගෙන්ම ලියාපදිංචිකිරීමේ නිලධාරිතැන විසින් ඉල්ලා සිටිනු ලැබේ. එසේ ආධාර කරන්නාවුන් කෙරෙහි ලියාපදිංචිකිරීමේ නිලධාරිතැන සතුටුවන්න වෙනවා ඇත.

ඉහතකී රාජ්‍යසභා නියෝගයේ 7වෙනි වගන්තිය යටතේ සුදුසුකම් ඇත්තාවූ යම් කිසිවෙකුට 1937 සැප්තැම්බර් මස 1වෙනි දින හෝ ඊට ප්‍රථමයෙන් එවැනි ගණන්ගැනීමේ මූලාදෑනියෙක් හමුවී නම දීමට බැරිවුනි නම් එම අය විසින් මෙම කන්තෝරුවට අප්‍රමාදව දැනුම්දිය යුතුයි.

ජේ. සී. ඩබ්ලිව්. රොක්,
උතුරු කොළඹ, මධ්‍යම කොළඹ සහ දකුණු කොළඹ ජන්දදායකයන් ලියාපදිංචිකිරීමේ නිලධාරිතැන.

1937ක්වූ අගෝස්තු මස 5වෙනි දින කොළඹ
රෙජිස්ට්‍රාර් ජනරාල් කන්තෝරුවේදීය.

**වර්ෂ 1896යේ අංක 13 දරණ වසූරිය රෝග පිළිබඳ ආඥාපනත.**

**මුන්නේස්සරම් දෙවස්ථානයේ මංගල්‍යය සම්බන්ධ ව්‍යවස්ථා.**

වසූරිය රෝග පිළිබඳ ආඥාපනතකැයි නම්ලත් 1896යේ අංක 13 දරන ආඥාපනතේ 1වෙනි වගන්තිය යටතේ ආණ්ඩුකාරයාණන්වහන්සේ විසින් පනවනලද ව්‍යවස්ථා.

සී. බී. ජයතිලක,
අභ්‍යන්තර කාර්‍ය්‍ය භාර මන්ත්‍රීතුමා.

වර්ෂ 1937ක්වූ අගෝස්තු මස 6වෙනි දින
අභ්‍යන්තර කාර්‍ය්‍ය භාර මන්ත්‍රීතුමාගේ
කන්තෝරුවේදීය.

ව්‍යවස්ථා.

1. මෙම ව්‍යවස්ථාවල " ලැගුම්භූමිය " යන්නෙන් හත වන්නේ මීට යාකර තිබෙන උප ලේඛනයෙහි සඳහන්වන සීමා තුළ පිහිටි භූමිභාගයයි. " උප දිසාපතිතුමා " යන්නෙන් හඟවන්නේ පුත්තලම හලාවත දෙපළාතේ උප දිසාපතිතුමායි.

2. උප දිසාපතිතුමාගේ විශේෂ හෝ සාමාන්‍ය ආඥාවකින් ලැගුම්භූමියතුළ ලැගුම්ගැනීම තහනම්කරනලද කිසිම ස්ථානයක කිසිවකු විසින් ලැගුම්ගත යුතුනොවේ.

3. ශරීර කෘත්‍ය සඳහා උප දිසාපතිතුමා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව වෙන්කර තිබෙන ස්ථානවල හැර ලැගුම්භූමිය තුළ අන් කිසිතැනක කිසිවකු විසින් මලමූත්‍ර නොකළ යුතුයි.

4. උප දිසාපතිතුමා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව ඒ සඳහා වෙන්කර තිබෙන ස්ථානවල හෝ භාජනවල මිස ලැගුම්භූමියේ වෙනතැනක කිසිවකු විසින් කුණුකසල රොඩු ආදිය හෝ කුණුවතුර නොදැමිය යුතුයි.

5. (a) ලැගුම්භූමිය තුළවත්තරත් ශාලක් වශයෙන් විශේෂයෙන් නියමකර තිබෙන තැනක හෝ ඒ සඳහා උප දිසාපතිතුමා විසින් මැනවැයි අනුමතකරනලද තැනක හෝ මිස ලැගුම්භූමිය අසල වෙන තැනකවත් නවසින් තබාගත යුතු නොවේ.

(b) ගවයින් භාරව සිටින අය විසින් ලැගුම්භූමිය ඇතුළත පහරන සතුන්ගේ ගොම ඇද ඒව නියම්කර තිබෙන ස්ථානයකට ගෙනයන්ට සැලැස්වීමද ගවයින් ලැග්ගන්නා තැන නිතරම පවිත්‍රව තබාගැනීමද යුතුවේ.

6. ආහාර පිණිස සාදා ලැගුම්භූමිය තුළ විකුණනුලබන සියලුම කෑම ජාති (a) පිරිසිදු කඩදාසිවල නොහොත් රෙදිවල දවටා හෝ ඉන් වසා හෝ, (b) වසනලද වීදුරු පෙට්ටිවල දමා හෝ, (c) ලැගුම්භූමිය බාර සනීපාරක්ෂක නිලධාරිතැන විසින් හෝ වෛද්‍ය නිලධාරිතැන විසින් මැනවැයි පිළිගන්නාලද වෙනත් පියන් සහිත භාජනවල දමා හෝ මැස්සන්ගෙන් හා දූවිල්ලෙන් ආරක්ෂාකළ යුතුයි.

7. බෝවෙන රෝගයකින් පෙළෙන කෙනකුට හෝ ලැගුම්භූමියේ පවිත්‍රකමට බාධාවක්ව සිටියහැකි කෙනකුට ලැගුම්භූමියට ඇතුල්වන්නට ඉඩනොදිය යුතුයි.

8. මංගල්‍ය කාලයතුළදී ලැගුම්භූමියෙහි යම් වසංගත රෝගයක් හටගැනුණි නම් වන්දනාකාරයින්ට වන්දනාභූමියෙන් පිටවීයන්නටද, පිටවී යන මාර්ගය සහ ඔවුන් ගෙනයන ක්‍රම නියමකරන්නටද උප දිසාපතිතුමාට පුළුවන.

9. (a) ලැගුම්භූමිය තුළ බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙළෙන සෑම අයද, (b) ඔහු එසේ පෙළෙන බව දැන දැනම ඔහු සමග වාසයකරන සෑම අයද ඒ රෝගියා ගැන ලැගුම්භූමිය බාරව සිටින සනීපාරක්ෂක නිලධාරිතැනට හෝ වෛද්‍ය නිලධාරිතැනට දැනුම්දෙන්නට ඕනෑය.

10. ලැගුම්භූමියතුළ යම් වැවක් හෝ ළිඳක් යම් නියම් කටයුත්තක් සඳහා වෙන්කොට ඒ බවට ඒ ස්ථානයෙහි දැන්වීමක් ගසා තිබෙනවිට එම වැව හෝ ළිඳ එය වෙන්කොට තබා තිබෙන කටයුත්ත සඳහා හැර අන්කිසි දෙයකට කිසිවකු විසින් නොයෙදිය යුතුයි.

11. පාන්ගෙයක් සිසිල්බීම සාදන ස්ථානයක් හෝ ගාලක් තැබීම පිණිස උප දිසාපතිතුමාගෙන් කලින් බලපත්‍රයක් ලබා නොගෙන කිසිවකු විසින් ලැගුම්භූමියතුළ එබඳු ස්ථානයක් තබාගත යුතුනොවේ. බලපත්‍රය නොමිලයේ දෙනු ලැබේ.

12. උප දිසාපතිතුමාගෙන් කලින් අවසර ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමියේ මග වීදියෙන් හෝ වෙනයම් විදියකින් ඇසුවනසේ යම් කඩයක් තැනීම හෝ වෙනයම් ගොඩනැගිල්ලක් දික්කිරීම යුතුනොවේ.

13. උප දිසාපතිතුමාගෙන් කලින් අවසර ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමිය තුළ හෝ එහි මායිම්වල සිට හැතැප්මක් ඇතුළත හෝ ගිනිකෙළි හෝ තුවක්කු පත්තු නොකළ යුතුයි.

14. උප දිසාපතිතුමා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව ඒ සඳහා නියමකර තිබෙන ස්ථානයක හැර ලැගුම්භූමිය තුළ කිසිවකු විසින් සතුන් නොමැරිය යුතුයි. තවද එබඳු ස්ථානයෙහි සතුන් මරන සෑම අයම එය පවිත්‍රව තබාගැනීම ගැන වගකිය යුතුවේ.

උප ලේඛනය.

මුන්නේශ්වරම් දේවාලයේ ලැගුම්භූමියේ සීමා.

උතුරට පාලකුලම, කොහොඹගස්පිටිය, මුත්තරංදවුව සහ මුන්නේශ්වරම්කුලම ; දකුණට මුන්නේශ්වරම්වෙල සහ නල්ලනයාගම්කුලම ; නැගෙනහිරට මුන්නේශ්වරම්කුලම, හලාවත සිට කුරුණෑගලට යන මහපාර සහ නල්ලනයාගම කුලම ; බස්නාහිරට මුන්නේශ්වරම්වෙල, හලාවත සිට කුරුණෑගලට යන මහපාර සහ පාලකුලම.

---

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

### 1931ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපනතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,583 (කුරුණෑගල).

මීට යටකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් හෝ ඒ ඉඩමේ යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1937ක්වූ අගෝස්තු මස 13වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකලොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපනතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒට කටයුතුකරන බවද එකී ආඥාපනතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

මේ 1937ක්වූ ජූනි මස 22වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

සී. එච්. හාර්ට්වෙල්,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

(a) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු වයඹ දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, එවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

(b) මෙකී ඉඩම උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට අයිතිකම්කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මෙහි පහත සඳහන් බිම්කට්ටිය වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වේඋඩවිලිහත්පත්තුවේ මහගල්බොඩ මෙගොඩ උතුරු කෝරළේ රත්මලේ පිහිටා තිබේ.

නො. A 496 දරණ මුල් සිතියම.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 | හැකන්රාලගේවෙලේහේන, නොහොත් කැහට ගහමුලහේන, නොහොත් එංගොඩවෙලේ මූකලාන .. .. | 14 1 16 |

මීට මායිම්—උතුරට අමුණුගම ගම්මායිමද; නැගෙණහිරට බඩුවැවේ ගම්මායිමද; දකුණට බඩුවැවේ ගම්මායිම සහ නො. 6,559 දරණ මුල් සිතියමේ සඳහන් නො. 1 දරණ ආණ්ඩුවට අයිති එංගොඩවෙලේහේනද; බස්නාහිරට රත්මලේ ඇළද වෙත්.

---

### 1931ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපනතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,584 (කෑගල්ල).

මීට යටකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1937ක්වූ අගෝස්තු මස 13වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකලොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපනතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒට කටයුතුකරන බවද එකී ආඥාපනතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

මේ 1937ක්වූ ජූනි මස 30වෙනි දින කෑගල්ලේ කච්චේරියේදීය.

කාල්. ඒ. ආන්ට්,
කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

(a) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකියි.

(b) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මෙහි පහත විස්තර පෙනෙන සබරගමු දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල්කෝරළේ කිරවැලි නැගෙනහිරපත්තුවේ පහල ලෙන්ගල යන ගමේ පිහිටා තිබෙන බිම්කට්ටි, එනම්:—

මුල් සිතියමේ නො. පී. පී. 2,890.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 3 | කළුගලේහේන නොහොත් කැකිල්ලේරන්ගේ බගේවිහේන .. .. | 9 1 25 |
| 3A | එම .. .. | 7 3 36 |
| | | 17 1 21 |

මීට මායිම්—උතුරට පී. පී. 2,890 දරණ මුල් සිතියමේ නො. 1 බිම්කට්ටිය, (T. P. 397,427), T. P. 101,488 සහ පී. පී. 2,890 නො. 2 බිම්කට්ටිය (T. P. 396,399); නැගෙණහිරට සුදුහකුරුගේ පුංචිඋන්ගා සහ තවත් අය අයිතිකම්කියන රන්ගේබගේවිහේන, T. P. 101,487 සහ පරදෙනියේ ඇල; දකුණට පරදෙනියේ ගම්මායිම; බස්නාහිරට පී. පී. 2,890 නො. 1 බිම්කට්ටිය (T. P. 397,427).

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3 වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාර්‍යයක් සඳහා, එනම්:—නාවලපිටිය–නුවරඑළිය පාරේ එකේ කනුවේ සිට පාර ගැරවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876 ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතවෙනි කාණ්ඩයේ කරතිබෙන සංශෝධනවල ප්‍රකාරයෙම උතුමාණන්වහන්සේගෙන් නියිඅකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 409. ගම—නාවලපිටි නගරය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | නාගරික නො. 153 වෙනි කොට සක්වූ බ්‍රිජ් එන්ඩ් ඇස්ටේට් | අවුරුදු 40ක පමණ රබර් ඇති වත්ත | බවුස්ටෙඩ් බ්‍රදර්ස් සමාගම භාරව තිබෙන නාවලපිටියේ ගොඩනැගිලි සමාගම | 0 0 34·94 |
| 3 | නාගරික නො. 153 වෙනි කොට සක්වූ බහපාර | අරක් පාර (අළුත් වෙන් කිරීම) | එම .. .. | 0 0 14·91 |
| 4 | නාගරික නො. 153 වෙනි කොට සක්වූ බ්‍රිජ් එන්ඩ් ඇස්ටේට් | අවුරුදු 40ක පමණ වයසැති රබර් මුල්කොට ඇති ඉඩම | එම .. .. | 0 0 9·42 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ නියමකරතිබෙන හැටියට මෙයින් දන්නුම්දෙමි.

ඉහත කී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1937ක්වූ සැප්තැම්බර් මස 16 වෙනි දින හවස 2ට කාලයට නාවලපිටියේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ බංගලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි ආකාරයේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණන් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1937ක්වූ අගෝස්තු මස 10 වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

එච්. ඇස්. ඇම්. හෝර්,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත වමයා.

---

## ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීම.

### අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

(මධ්‍යම පළාතියේ ලාංකිකයන් සම්බන්ධයෙනි.)

මෙහි පහත විස්තර දැක්වෙන ඉඩම් සඳහාවූ ඉල්ලුම්පත්‍ර කල්පනාවට ගනු පිණිසත් කොටස් වශයෙන් ඒ ඉඩම්වලට අවසර පත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගැනීම පිණිසත් කුරුණෑගල කච්චේරියේදී වර්‍ෂ 1937ක්වූ සැප්තැම්බර් මස 30 වෙනි දින පූ. භා. 11ට 1935 අංක 19 දරන ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් වයඹ දිසාවේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. මේ ඉඩම්කට්ටි මධ්‍යම පළාතියේ ලාංකිකයන්ට පමණයි.

3. සියලුම ඉල්ලුම්පත්‍ර ආණ්ඩුවේ ඒජන්තතුමා වෙත කුරුණෑගල කච්චේරියට වර්‍ෂ 1937ක්වූ අගෝස්තු මස 30 වෙනි දින හෝ ඊට මත්තෙන් ලැබිය යුතුයි.

4. ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම්කර තිබෙන ප්‍රමාණයේ හැටියට අක්කරයට රුපියල් 3 බැගින් වැටහෙන මුදලක් සියලුම ඉල්ලුම්පත්‍රත් සමග එවිය යුතුයි. ඉල්ලුම්කරුගේ ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා වුවමනා නැති අමතර මැනීමක් කිරීමට ආණ්ඩුවට සිදුවුවහොත් මේ මුදල ආපසු දෙනු නොලැබේ. එබඳු ඒ මුදලක් ඒ ඒ විශෙෂ අවස්ථාවලදී ආපසු දීම හෝ නොදීම යුක්තිසහගතදැයි යන්න ගැන ඉඩම් කොමසාරිස් තුමන් විසින් කරන තීරණය අවසාන තීරණය වන්නේය.

5. සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි. ඉල්ලුම්කරු, නියෝජිත යන දෙදෙනාගෙන් එක්කෙනෙකුවත් ඉඩම් කච්චේරියට නොපැමිණියොත් ඉල්ලුම්කරු තම ඉල්ලීම සම්බන්ධයෙන් තවදුර වත් ක්‍රියාකිරීමට අකැමැති බැව් ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් සලකනු ලැබේ.

මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාග කළ යුතුයි.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

වර්‍ෂ 1937ක්වූ අගෝස්තු මස 5 වෙනි දින
ඉඩම් කොමසාරිස්තුමාගේ කන්තෝරුවේදීය.

දීමට යන ඉඩම්වල විස්තර.

F. V. P. සිතියමේ නො. 1,854. ගම—දිවුල්ලෑව.

| කැබෙල්ල. | ප්‍රමාණය (කිට්ටු වශයෙන්). අ. රූ. ප. | මේ ඉඩම්වල වැවීමට සුදුසු ශාක වගී. |
|---|---|---|
| 7 | .. 9 0 22 | පොල්, දෙහි, දොඩම් යනාදි ගස්වගී සහ කජු, මිරිස්, දුම්කොළ සහ තිරිඟු යනාදිය. |
| 8 වේ නැගෙණහිර කොටස | 67 1 5 | |
| 27 වෙනි කොටසක් | .. 30 0 9 | |
| 27A | .. 4 0 8 | |
| | 110 2 4 | |

### දීමනා පත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

මෙහි පහත විස්තර දැක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනා පත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස දැල්ඔබුල්ලේ ගම් සභා උසාවියේදී වර්‍ෂ 1937ක්වූ සැප්තැම්බර් මස 10 වෙනි දින පූ. භා. 10ට 1935 අංක 19 දරණ ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

වර්‍ෂ 1937ක්වූ අගෝස්තු මස 5 වෙනි දින
ඉඩම් කොමසාරිස්තුමාගේ කන්තෝරුවේදීය.

දීමට යන ඉඩම්වල විස්තර.

F. V. P. ප්ලෑනේ අංකය 33. ගම—හල්පාවිල.

| කැබෙල්ලේ අංකය. | අවසර පත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම. | ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|
| 22 | එච්. එස්. ජයවර්ධන .. .. | 2 0 15 |
| 23 | ඩී. ඇස්. සර්නේලිසා .. .. | 2 0 7 |
| 24 | වයි. බබසිඤ්ඤො .. .. | 1 3 11 |
| 27 | ඇල්. එච්. සාදිරිසා .. .. | 2 0 9 |
| 28 | එච්. දුවිනා .. .. | 2 0 13 |
| 30 | ඇම්. මොහොට්ටිහාමි .. .. | 2 3 29 |
| 31 | ජී. ඇල්. කිලන්චියා .. .. | 1 0 21 |
| 32 | ඇන්. ජී. මුදියන්සේ .. .. | 1 1 24 |
| 33 | ඇම්. ආර්. සිත්ගනේහාමා .. | 1 3 26 |
| 34 | එච්. සවුන්ද්‍රිස් .. .. | 2 1 27 |
| 35 | එච්. යසෝහාමි .. .. | 2 1 28 |
| 36 | ඇම්. කිරියන්චියා .. .. | 2 0 12 |
| 37 | පී. ඇම්. කිරිමුදියන්සේ .. .. | 2 0 22 |
| 38 | ඇන්. බී. ජේ. අප්පුහාමි .. | 1 3 2 |
| 39 | එම .. .. | 0 1 0 |
| 41 | ජී. ආර්. බබානෝනා .. .. | 2 3 17 |
| 43 | පී. ජී. අප්පුහාමි .. .. | 1 0 12 |
| 44 | ජී. කිරිලච්චියා .. .. | 1 1 0 |
| 45 | ඇම්. අන්දිරිසා .. .. | 2 1 7 |
| 47 | පී. ජී. ජේම්ස් .. .. | 1 0 12 |
| 50 | ජේ. සියනේරිස් .. .. | 1 3 38 |
| 53 | ජේ. අල්ලිස්සිඤ්ඤො .. .. | 2 0 3 |
| 54 | කේ. දියෝනිස් .. .. | 1 3 37 |
| 56 | ඇල්. එච්. කිරිමැනිකා .. .. | 0 3 24 |
| 57 | එච්. බබාසිඤ්ඤො .. .. | 0 3 32 |
| 58 | එච්. සිඤ්ඤො .. .. | 1 3 37 |
| 59 | එච්. මනන්චියා .. .. | 0 3 18 |

| කැබැල්ලේ අංකය. | අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම. | ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|
| 61 | ඩබ්ලිව්. ජී. අලෙන්සා .. .. | 1 0 13 |
| 62 | පී. පුන්චිහේනයා .. .. | 1 0 0 |
| 63 | එච්. ජේ. බන්ඩුලහාමි .. .. | 1 3 24 |
| 65 | පී. ඩිංගිරිහේනයා .. .. | 1 3 12 |
| | F. V. P. ප්ලෑනේ අංක 29. ගම—හන්දුරුකන්ද. | |
| 33 | ඩබ්ලිව්. ජේ. හෙන්ද්‍රික් අප්පුහාමි .. | 2 2 35 |
| 36 | ඇම්. පුන්චිසෙලොන්චියා.. ... | 2 2 14 |
| 39 | ජේ. කිරිඅන්සා .. .. | 2 1 31 |
| 40 | ඇල්. කිරිබිංගා .. .. | 1 0 34 |
| 43 | ඇල්. බබාසිඤ්ඤො .. .. | 1 0 24 |
| 44 | යූ. ඇම්. කිරිබබා .. .. | 1 2 34 |
| 46 | කේ. බබාසිඤ්ඤො .. .. | 2 2 26 |
| 54 | ආර්. විජේහාමි .. .. | 2 0 17 |

| කැබැල්ලේ අංකය. | අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම. | ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|
| | F. V. P. ප්ලෑනේ අංක 197. ගම—බෝපිටිය. | |
| 250 | ජී. අබෙන්රිස් සිල්වා .. .. | 0 0 7 |
| 251 | එම .. .. | 1 3 39 |
| 253 | එම .. .. | 1 3 35 |
| 259 | ඇල්. පීටර්සිඤ්ඤො .. . | 0 2 33 |
| 262 | කේ. වී. හරමානිස් .. .. | 0 2 27 |
| 266 | ඊ. ඇම්. අප්පුහාමි .. | 0 2 28 |
| 267 | පී. ලෙදන් හෙන්ද්‍රික් .. .. | 1 0 25 |
| 269 | ජී. ඇම්. බාලයා .. .. | 0 3 39 |
| 277 | ඩී. ජේ. ඇස්. රනවීර .. .. | 1 3 25 |
| 278 | ජී. බබාසිඤ්ඤෝ .. .. | 1 2 39 |
| 282 | ජී. ඇම්. බබානිසා .. .. | 1 3 28 |

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.